# යාපහුව ප්‍රදේශයේ මුල් බෞද්ධ ආරාමවලට අයත් පුරාසාධකවලට අනුව හෙළිවන එම ප්‍රදේශයේ සමාජ ආර්ථික පසුබිම

ඩබ්. එම් ශිරන්ත රුවන් වාසල[1]

යාපහුව ප්‍රදේශයේ ආරාමවල ආරම්භය ප්‍රාග් ඓතිහාසික යුගයට ගමන් කරන බවට සාධක ඇත. මෙම ප්‍රදේශයෙන් ප්‍රොටෝ ඓතිහාසික යුගයට අයත් සුසාන ක්ෂේත්‍ර හමු වී තිබේ. එම නිසා මේ ආශ්‍රිත ජනාවාස තිබෙන්නට ඇත. එමෙන්ම මුල් ඓතිහාසික යුගයට අයත් ආරාම ආශ්‍රිත ගල් ලෙන් බොහොමයක් යාපහුව ප්‍රදේශයේ දක්නට ලැබේ. මේවායෙහි ව්‍යාප්තිය දෙස බැලීමෙහි දී භික්ෂූන් වහන්සේලාට යැපීමට අවශ්‍ය ගොදුරු ගම් විහාරාරාම අවට ප්‍රදේශයේ තිබුණු බව පෙනේ.

විහාරාරාම විශාල වශයෙන් මේ ප්‍රදේශයේ ව්‍යාප්ත වීමට ප්‍රතිලෝම වශයෙන් හේතු වූයේ ග්‍රාමීය ජනාවාස පද්ධතියයි. එම ග්‍රාමීය ජනාවාසවල පැහැදිලි සාධක දක්නට නැතත් ඒ මිනිසුන් විසින් හදන්නට ඇති කුඩා පරිමාණයේ වැව් විශාල පද්ධතියක් දක්නට ලැබේ. මෙම වැව් පද්ධතියෙහි ව්‍යාප්තික අවකාශය දෙස බලන විට බොහෝ දුරට වැව් කිහිපයකට එක ගල් ලෙන් පද්ධතියක් ආශ්‍රිත විහාරාරාමයක් පිහිටා ඇත. ක්‍රමයෙන් මිනිසුන්ගේ අනුගහ්‍රය ලැබීම, එම විහාර සංකීර්ණත්වය කරා එළඹීමට හේතුවන්නට ඇත.

මෙම විහාර ආශ්‍රිත නිර්මිත පරිසරය ප්‍රදේශයේ ප්‍රජාවගේම දායකත්වයෙන් ගොඩනැගෙන්නට ඇත. මුල් බෞද්ධ ආරාම, ඒවායෙහි සමාජ ආර්ථික පදනම, පුරාවිද්‍යාත්මක සාධක අනුව විමර්ශණය කිරීම මෙම පරීක්ෂණයේ අරමුණයි.

**ප්‍රමුඛ පදඃ** යාපහුව, මුල් බෞද්ධ ආරාම, වැව් පද්ධතිය, ගොදුරු ගම්

---

1 උපාධි අපේක්ෂක, දෙවන වසර, පේරාදෙණිය විශ්වවිද්‍යාලය